**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 01/2001**


රාජ්‍ය පරිපාලන , ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,කොළඹ 07.

**2001.ජනවාරි මස 03 දින.**

**අමාත්‍යාංශ ලේකම්වරුන්,**
**දිස්ත්‍රික් ලේකම්වරුන් සහ**
**දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.**

**කාර්යාල සේවක සේවයේ උසස්වීම්**

2000.2.31 වෙනි දිනට තම අමාත්‍යාංශවල / දෙපාර්තමේන්තු වල පවතින කාර්යාල සේවක සේවයේ උසස්වීම් මගින් පිරවිය යුතුව ඇති පුරප්පාඩු පිරවීමට ඉක්මනින් කටයුතු කරන ලෙස සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

02. කාර්යාල සේවක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් අංක 660/10 දරණ 1991 මැයි මස 03 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ 11 හා 12 වගන්ති (උසස් කිරීම්) සංශෝධනය කිරීම සඳහා නිකුත් කල 722/16 හා 1992 ජූලි මස 08 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ දැක්වෙන පරිදි එම සේවාවේ උසස්වීම් කළ යුතුවේ. ඒ අනුව කා.සේ.සේ II පන්තියේ පුරප්පාඩු කා.සේ.සේ III හා III ‘අ’ පන්තියේ තනතුරුවල ස්ථිර කරන ලද හා 2000.12.31 වෙනි දින වන විට වසර 03 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් උසස් කිරීමෙන් පිරවිය යුතුය.

03. කාර්යාල සේවක සේවයේ I පන්තියේ පුරප්පාඩු පූරවනු ලබන්නේ 2000.12.31 වෙනි දිනට කා.සේ.සේ II පන්තියේ තනතුරක අවුරුදු 09 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්තා වූද, උසස්වීම් ලබන දිනට පූර්වාසන්නව අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් ඇත්තා වූද, නිලධාරීන් උසස් කිරීමෙනි.

04. ජ්‍යෙෂ්ඨත්වය පදනම් කරගෙන අමාත්‍යාංශ මට්ටමින් මෙම උසස්වීම් කළ යුතු අතර, ජ්‍යෙෂ්ඨත්වය සඳහා මුළු ලකුණු 100 ක උපරිමයක් ගණන් ගත යුතුය. එක් වසරක ජ්‍යෙෂ්ඨතාවයට ලකුණු පහ (05) බැගින් අදාල වර්ෂ ගණන අනුව ජ්‍යෙෂ්ඨත්වය ගණන් බැලිය යුතුය.

05. කා.සෙ.සේ I පන්තිය හා II පන්තිය සඳහා උසස්වීම් ලිපි නිකුත් කරනු ලබන්නේ කා.සෙ.සේ I පන්තිය හා II පන්තිය වශයෙන් පමණක් වන අතර පවතින පුරප්පාඩු අනුව අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඒ ඒ පන්තියට අදාලව කාර්යාල සේවක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ ‘අ’ උප ලේඛණයේ සඳහන් තනතුරුවල ස්ථාපිත කළ යුතුය.

06. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර , ඒ සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂකගේ පූර්ව අනුමැතිය ලබා තිබිය යුතු වේ.

07. දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් තම දෙපාර්තමේන්තු වල පවතින පුරප්පාඩු අදාල අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා යැවිය යුතු අතර අමාත්‍යාංශයට අයත් ඒකාබද්ධ සේවයේ සුදුසුකම් ඇති ස්ථිර සියළුම කණිෂ්ඨ සේවකයන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කළ යුතුය.

08. උසස්වීම් පිරිනැමීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශයන්, අමාත්‍යාංශය යටතේ I පන්තියේ හා II පන්තියේ 2000.12.31 වෙනි දිනට පැවති පුරප්පාඩු සංඛ්‍යාවන්, අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශයන් සමඟ මා වෙත එවිය යුතුය.

09. 2001.04.30 දිනට ප්‍රථම මෙම උසස්වීම් සියල්ල ලබා දී අවසන් කළ යුතු අතර මේ වන විටත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/99 යටතේ උසස්වීම් සිදු කර නොමැති යම් අමාත්‍යාංශයක් වේ නම් මුලින්ම එම උසස්වීම් කිරීමෙන් පසු, මෙම චක්‍රලේඛය ප්‍රකාර උසස්වීම් ලබා දීමට කටයුතු කළ යුතුය.



එම්.එන්.ජුනයිඩ්
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.